# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/26 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය**

2018 අංක 35 දරන මුදල් (මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද) පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් අංක 2147/72 දරන 2019 ඔක්තෝබර් 31 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග, එහි 4 වන රෙගුලාසියේ (ආ) ඡේදය පහත පරිදි ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

> ''(ආ) 2019 මාර්තු මස 06 වන දින සිට 2019 ඔක්තෝබර් මස 31 වන දින දක්වා කාලය තුළ විවෘත කරන ලද ණයවර ලිපියක් මත ආනයනය කරන ලද සිලින්ඩර් ධාරිතාව 1800 සී. සී. නොඉක්මවන ඕනෑම පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර ධාරිතාව 2300 සී. සී. නොඉක්මවන ඕනෑම ඩීසල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 නොඉක්මවන විදුලි බලයෙන් ක්‍රියා කරන ඕනෑම වාහනයක් එකී ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනයේ විස්තරය හෝ ප්‍රමාණය හෝ තාක්ෂණික පිරිවිතර හා එකී ණයවර ලිපියේ වටිනාකම හෝ කල්පිරෙන දිනය සංශෝධනය නොකිරීමට සහ 2020 මැයි මස 31 දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගනු ලැබීමට යටත්ව මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්දට යටත් නොවේ.''

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

03 - 206

1A - PG 4888 — 567 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*